www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපදය දෙවන කාර්තුවේ ආර්ථික වර්ධන ඇස්තමේන්තු පහත හෙලයි

## US slashes estimate of second-quarter economic growth

**බැරී ග්‍රේ විසිනි**

**2010 අගෝස්තු 28**

27 වන දින වෙළඳ දෙපාර්තමේන්තුව විසින් එක්සත් ජනපදයෙහි දෙවන කාර්තුවේ ආර්ථික වර්ධනය පිලිබඳ ඇස්තමේන්තු තියුනු ලෙස පහත හෙලීය. දෙපාර්තමේන්තුව විසින් දල දේශීය නිෂ්පාදිතය (දදේනි) සියයට 2.4 න් වර්ධනය වන බවට ජූලි 30 දින නිකුත් කල සිය ආරම්භක ඇස්තමේන්තු වඩාත් මන්දෝත්සාහී සංඛ්‍යාවක් එනම් සියයට 1.6 දක්වා පහත හෙලීය.

සියයට 2.4 වර්ධන වේගය වුවත් පෙර කාර්තුවල මට්ටමෙන් තියුනු ලෙස පල්ලම් බැසීමක් සනිටුහන් කර තිබුනි. 2009 අවසන් කාර්තුවේ එක්සත් ජනපද දදේනි සියයට 5න් ද මෙම වසරේ මුල් කාර්තුවේ සියයට 3.7 ද වැඩිවිය. සියයට 1.6 වර්ධන අනුපාතය, විරැකියාව තව දුරටත් ඉහල යාම වැලැක්වීම සඳහා අවශ්‍ය යයි අර්ථශාස්ත්‍රඥයින් සලකනු ලබන අවම අවකාශය වන සියයට 2.0-2.5 අතර මට්ටමට ද වඩා පහත් අගයකි.

ආර්ථික වර්ධනයේ තියුනු හැකිලීමක් පෙන්නුම් කල ආර්ථික දර්ශක මාලාවක් නිකුත්වීමෙන් පසුව මෙම කප්පාදු කල වර්ධන අගය පුලුල් ලෙස අපේක්ෂා කරනු ලැබුනි. බොහෝ අර්ථශාස්ත්‍රඥයින් දැන් අනාවැකි පල කරන්නේ එක්සත් ජනපද ආර්ථිකය, 2010 ඉතිරි කාලසීමාව තුල සියයට 2 කට වඩා අඩු වර්ධනයක් පෙන්නුම් කරනු ඇති බවට හා සමහරෙක් අනතුරු අඟවන්නේ "දෙපසකින් පහර දෙන" රින වර්ධනයක් බවට එය පිරිහෙනු ඇති බවටයි. මේ සතිය තුල ගෝල්ඩ්මන් සැක්ස් ආර්ථික විශ්ලේෂකයින් සියයට 25-30 අතර දෙපැත්තෙන් පහරදීමේ පසුබෑමක ඉඩකඩ පෙන්වා දුන්නේ ය.

මෙම දුර්මුඛ ආර්ථික යථාර්තයන් හා එහි ප්‍රතිපල වශයෙන් දශ ලක්ෂ සංඛ්‍යාත ඇමරිකානුවන් මුහුනපාන සමාජ ව්‍යසනය මධ්‍යයේ ඔබාමා පාලනාධිකාරය හා මහ බැංකු අධිපතියෝ වර්ධනය අපේක්ෂා කලාට වඩා අඩු යයි පිලිගන්නා අතරම ආර්ථික "ප්‍රකෘතිමත්වීමක්" ගැන නොකඩවා කථාකරති. වැටුප් කප්පාදු හා වැඩ වේගවත් කිරීම පිලිගන්නා තැනට කම්කරුවන් තල්ලුකර ගැනීමේ අරමුනෙන් විරැකියාව ඉහල මට්ටමක තබාගන්නා අතර චීනය හා අනෙකුත් "නැගීඑන" ආර්ථිකයන්හි කම්කරුවන්ගේ මට්ටමට ඇමරිකානු කම්කරුවන් සූරාකෑම ස්ථාවර ලෙස ඉහල නැංවීමේ මනාව සූදානම් කෙරෙන පිලිවෙතක් යුක්තිසහගත කිරීම සඳහා මෙම මන්ත්‍රය ජපකරනු ලබයි.

27 දින ප්‍රකාශිත තීරුවක් තුල අර්ථශාස්ත්‍රඥ හා *නිව් යෝර්ක් ටයිම්ස්* තීරු රචක පෝල් කෘග්මාන්, එදින පැවැත්වීමට නියමිත මහ බැංකු සභාපති බෙන් බර්නන්කේගේ කථාවක් ගැන සඳහන් කරමින් මෙසේ පැවසීය. "එහෙත් ඔහු හා අනෙක් නිලධාරීන්, ඔවුන් සතුටට පත්වනවාට වඩා හෙමින් වුවත් ආර්ථිකය ප්‍රකෘතිමත් වෙමින් තිබෙන තැනකට අප පැමින සිටින්නේ යයි කියනු ඇති බව අපට ප්‍රවේශමෙන් සිතාගත හැකිය. අවාසනාවකට මෙන් එය සත්‍ය නොවේ. අදාල කුමන අර්ථයකින් වත් මෙය ප්‍රකෘතිමත් වීමක් නොවේ."

"වැදගත් ප්‍රශ්නය වන්නේ, අහස උසට නැඟ තිබෙන විරැකියාව පහත හෙලීමට ආර්ථික වර්ධන වේගය සෑහෙන්නේ ද යන්නයි. විරැකියාව වැඩි නොවී පවත්වා ගැනීමට සියයට 2.5 වර්ධනයක් වත් අපට අවශ්‍යය. විරැකියාව සැලකිය යුතු තරමින් පහත හෙලීමට නම් ඊට වැඩි වේගයක් අවශ්‍ය වනු ඇත. එහෙත් වර්ධනය දැනට පවතින්නේ සියයට එකත් දෙකත් අතර කිසියම් තැනකය. එමෙන්ම එලඹෙන මාසවලදී එය තව දුරටත් මන්දගාමී වීමේ වැඩි ඉඩ කඩක් පවතින තැනකය."

ඔබාමාගේ ආධාරකරුවෙකු හා ලිබරල් ඩිමොක්‍රටිකයෙකු වන කෘග්මාන්, ඉහල විරැකියාව සෙත සලසන පන්ති අවශ්‍යතාවන් හා රැකියා අර්බුදය ධනේශ්වර ක්‍රමයේ පද්ධතිමය අර්බුදය තුල මුල්බැස තිබෙන ආකාරය සැඟවීමට උත්සාහ කරන අතර වාරයේ ආර්ථිකයේ යථා ස්වභාවය ද පෙන්වා දෙයි.

සිය වාර්තාව තුල වානිජ්‍ය දෙපාර්තමේන්තුව, වර්ධනයේ මන්දගාමී බව ප්‍රධාන කොටම "ආනයනයන්ගේ තියුනු නැගීම හා භාන්ඩ තොගවල පුද්ගලික ආයෝජන පහත වැටීම" නිසා ජනනය කල දෙයක් ලෙස ගුනාංගීකරනය කරයි. එය විශේෂයෙන්ම වෙලඳ හිඟය කෙරේ අවධානය යොමු කරයි. එය මාස 19 ක ඉහලම මට්ටම සලකුනු කරමින් ජූනි මාසයේදී බිලියන 50 න් එනම් සියයට 16 න් ඉහල නැගුනි. 1947 න් පසුව වෙලඳ අසමතුලිතයට වැඩිම බලපෑම කරමින් වෙලඳ ශේෂය දෙවන කාර්තුවේ වර්ධනයෙන් 3.4 ක පමන ප්‍රතිශත අගයක් කාදැමූ බව වාර්තාව සඳහන් කරයි.

දදේනි වාර්තාව අවසන් කරන්නේ, සතියක ආර්ථික දත්ත, මහා අවපාතයෙන් පසුව එලඹි නරකම ආර්ථික අර්බුදය ගැඹුරු නොකරන්නේ නම් නොකඩවා ඉදිරියට යන බව සනාථ කරමිනි. ජූලි මාසය තුල පවත්නා නිවාස අලෙවිය හා නව නිවාස අලෙවිය පිලිබඳව 24 හා 25 දිනවල නිකුත්වූ වාර්තා පිලිබිඹු කරන්නේ නිවාස වෙලඳපොල අඛන්ඩව වැටෙමින් ඇති බවයි. පවත්නා පැරනි නිවාස අලෙවිය 1995 න් පසු පහතම මට්ටමට ඇද වැටෙමින් ජූනි මාසයට වඩා වාර්තාගත සියයට 27.2 න් හැකිලී ගියේය. පෙර මාසය සමග සසඳන කල නව නිවාස අලෙවිය සියයට 12 න් ද 2009 ජූලි මාසයට වඩා සියයට 32.4 න් ද පහත වැටුනි. එය වාර්තා තැබීම ආරම්භ කල 1963 න් පසු පහතම අගයයි.

25දා වෙලඳ දෙපාර්තමේන්තුව වාර්තා කලේ කල්පවත්නා භාන්ඩ ඇනවුම් ජූනි මාසයට වඩා ජූලි මාසයේදී වැඩිවී ඇත්තේ සියයට 0.3ක ඉතා සුලු ප්‍රමානයකින් බවය. ආර්ථික විශ්ලේෂකයන් අනාවැකි පලකොට තිබුනේ සියයට 3.0 න් වැඩිවන බවටය. ප්‍රවාහන ආම්පන්න හැරුනුකොට ප්‍රධාන ඇනවුම් 2009 ජනවාරියෙන් පසු ලොකුම වැටීම සලකුනු කරමින් සියයට 3.8 න් පහත බැස්සේය. යන්ත්‍රෝපකරන ඇනවුම් සියයට 15 න් ද පරිඝනක හා විද්‍යුත් උපකරන සියයට 2.4 න් ද පහත ගියේය.

24දා කැන්සාස් සිටි මහ බැංකුව සිය නිෂ්පාදන දර්ශකය ප්‍රකාශයට පත්කලේය. ඒ අනුව ජූලි මාසයේ සියයට 14 සිට අගෝස්තුවේ සියයට 0 දක්වා එය පහල ගියේය. එම වාර්තාවේ රැකියා දර්ශකය ද රින අගයන්ට පහත වැටුනු අතර ඉදිරි මාස හය සඳහා ඇති බලාපොරොත්තු සුන්වී ඇති බව බැංකුව සඳහන් කලාය. ඊට පෙර ෆිලඩෙල්ෆියා මහ බැංකුව පසුගිය සතියේ පලකල වාර්තාවකට අනුව මධ්‍ය-අත්ලාන්තික් ප්‍රදේශයේ නිෂ්පාදනය ඒ හා සමාන මට්ටමකින් පහත වැටී තිබුනි.

පූර්ව මාස කිහිපය දක්වා එක්සත් ජනපද ආර්ථිකයේ සාපේක්ෂව ආලෝකමත් ලක්ෂ්‍යය වූයේ නිෂ්පාදනයයි. "නිෂ්පාදන ක්ෂේත්‍රයේ ගතිකය ඉක්මනින්ම පහව යන බවට කනස්සල්ලක් මෙම දත්ත විසින් අවුලුවාලීම නිසැක ය" යනුවෙන් ආර්බීඑස් ඉකොනොමික්ස් රිසර්ච්හි අර්ථශාස්ත්‍රඥ මයිකල් ගිරාඩ් *ෆිනෑන්ෂල් ටයිම්ස්* වෙත පැවසීය.

26දා කම්කරු දෙපාර්තමේන්තුව විරැකියා සහන පිලිබඳ එහි සතිපතා සමීක්ෂනය එලිදැක්වීය. වාර්තාව, මාසය තුල පලමු වරට විරැකියා සහන ඉල්ලන සංඛ්‍යාවේ ප්‍රථම පහත වැටීම නිවේදනය කල ද එය, ශ්‍රම බලකායේ වර්ධනයට සරිලන පරිදි රැකියා නිර්මානය කිරීමට අවශ්‍ය මට්ටමක පවතින ආර්ථිකයක් පිලිබඳව ඇඟවුම් කරන 400,000 ක මට්ටමට වඩා බෙහෙවින් ඉහල 473,000 මට්ටමේ පැවතුනි. තව ද, ඉල්ලීම්වල සති හතරක සාමාන්‍යය පසුගිය නොවැම්බරයෙන් පසු එහි ඉහලම මට්ටමට නැගුනි. සිය සම්ප්‍රදායික සහන ක්ෂයවී යාමෙන් පසුව දැන් හදිසි හෝ දීර්ග කාලීන සහනාධාර ඉල්ලා සිටින මිනිසුන්ගේ සංඛ්‍යාව 302,000 න් ඉහල නැංගේය. දැන් මිලියන 5.84 මට්ටමේ පවතින දිගුකාලීන විරැකියා අනුපාතය පිලිබඳ මෙම මිනුම 1930 ගනන් වලින් පසු සියලු වාර්තා බිඳහෙලමින් තිබේ.

27දා වයෝමිං ප්‍රාන්තයේ ජැක්සන් හෝල්හි කැන්සාස් සිටි මහ බැංකුවේ වාර්ෂික ආර්ථික සම්මන්ත්‍රනය අමතා මහ බැංකු අධිපති බෙන් බර්නන්කේ බෙහෙවින් බලාපොරොත්තු දැල්වී තිබුනු සිය කථාව පැවැත්වූයේ මෙම සන්දර්භය තුලය. අවස්ථාවට සහභාගී වූවන් අතර ලෝකය පුරා ආන්ඩුවල මුදල් අමාත්‍යවරු හා මහ බැංකු ප්‍රධානීන් ද ලෝක බැංකුවේ හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රමුඛ නිලධරයන් ද වෝල් වීදියේ අර්ථශාස්ත්‍රඥයින් ද විද්වතුන් හා මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදක ෆෙඩරල් විවෘත වෙලඳපොල කමිටු සාමාජිකයෝ ද වූහ.

අගෝස්තු 10 දින පැවති ප්‍රතිපත්ති පිලිබඳ රැස්වීමේදී මහ බැංකුව නිවේදනය කල මැදහත් පිලිවෙත් වලට වඩා දුරදිග යන නව උත්තේජක පියවර, නරක අතට හැරෙන ආර්ථික තත්වය හමුවේ බර්නන්කේ විසින් එලිදක්වනු ඇති බවට බොහෝ බලාපොරොත්තු පලවී තිබුනි. එම රැස්වීමේදී මහ බැංකු විවෘත වෙලඳපොල කමිටුව කියා සිටියේ තමන් අතැති උකස්කර පිටුබලය සහිත කල් පිරුනු සුරකුම් වලින් ලැබෙන මුදල්, බැංකුවේ පමන ඉක්මවා ඇති ශේෂ පත්‍ර වගකීම් මුදාහැරීමට නොව දිගු කාලීන භාන්ඩාගාර බිල්පත් මිලට ගැනීමට යොදවන බවයි.

මෙම බෙහෙවින් සංකේතාත්මක පියවර සැලසුම්කොට තිබුනේ මහ බැංකුව, පද්ධතිය තුලට අඛන්ඩව ලාභ නය සම්පාදනය කරන අතරතුර රැකියා

නිර්මානය සඳහා සැලකිය යුතු බැරෑරුම් කිසිදු පියවරක් නොගන්නා බවට වෙලඳපොලවලට සහතික වීම සඳහා ය.

27 දින පැවත්වූ කථාවේදී බර්නන්කේ, දැනට ප්‍රකාශයට පත්කොට ඇති පිලිවෙත හා මුලින් පාවිච්චියට ගත් පුරසාරම් පුලුල් වශයෙන් පුනරුච්ඡාරනය කලේය. මහ බැංකුව පූර්වාපේක්ෂා කලාට වඩා හෙමින් ක්‍රියාත්මක වුවත් ආර්ථික "ප්‍රකෘතිමත්වීම" දිගටම සිදුවන බව ඔහු අවධාරනය කලේය. වියදම් අධික භාන්ඩාගාර බිල්පත් මිලට ගැනීම ද ඇතුලු නව පියවර ගැනීමට මහ බැංකුව සූදානමින් සිටින ඔහු යලි කියා සිටියේය. එහි අවසන් නිගමනය ආර්ථිකය රිනාත්මක වර්ධනයක් කරා පල්ලම් බැසීම වුවත් එම මග වෙනස් කිරීමේ ක්ෂනික සැලසුම් නොමැති බව ඔහු පැහැදිලි කලේය.

"සාපේක්ෂ වශයෙන් සුලු අනුපාතයකට අනුව වුවත් මෙම වසරේ දෙවැනි භාගයෙහි ආර්ථිකය දිගටම ප්‍රසාරනය වේ යයි මම බලාපොරොත්තු වන්නෙමි." දෙවන භාගයේ මන්දගාමී ස්වභාවය තිබියේ වී වුවත් "2011 වසරේ වර්ධනය ජවය ගනු ඇති බවට පූර්ව කොන්දේසි දිස්වන්නට පටන් ගෙන තිබේ" යයි ඔහු පැවසීය.

මෙම ප්‍රතිඥා වෝල් වීදිය ඉතසිතින් පිලිගෙන තිබේ. ඩව් ජෝන්ස් කාර්මික දර්ශකය ඒකක 164 කින් නැගුනු අතර එක්සත් ජනපදයේ සියලු කොටස් දර්ශක අවසන් වූයේ තියුනු නැග්මක් සහිතව ය. කම්කරු පන්තියේ වියදමෙන් එක්සත් ජනපදයේ පන්ති සම්බන්ධතා සපීර ලෙස ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රැකියා අර්බුදය යොදාගන්නා අතර රින වර්ධනයක් කරා පල්ලම් බැසීම වලක්වා ගැනීමට උත්සුකවී සිටින මහ බැංකුවේ හා ඔබාමා පරිපාලනයේ ප්‍රවිෂ්ටය එක්සත් ජනපදයේ ව්‍යාපාරික හා මූල්‍ය ප්‍රභූ පැලැන්තිය පොදුවේ සාදරයෙන් පිලිගනු ලබයි.

සීඑන්බීසී බිස්නස් කේබල් චැනල් වෙත 27දා එක් ප්‍රකාශකයෙකු සඳහන් කල පරිදි එක්සත් ජනපද සමාගම් ඉතිහාසයේ වෙනත් කිසිම කාර්තුවක් තුල ලබා ගත්තාට වැඩි ඉහල ලාභයක් දෙවන කාර්තුව සඳහා අත් කර ගෙන තිබේ.

© www.wsws.org